# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO
1456/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
11/09/2024
පැය 1745

**මාධ්‍ය නිවේදනය**

**සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලට සම්බන්ධ තර්ජනාත්මක වීඩියෝවක් පිළිබඳව - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

පසුගිය දිනක එක්තරා දේශපාලන පක්ෂයක් විසින් පවත්වන ලද මැතිවරණ ප්‍රචාරණ රැස්වීමක් සඳහා සහභාගී වූ පුද්ගලයකු විසින් සමාජ මාධ්‍ය හරහා වීඩියෝ පටයක් ඔස්සේ, අනෙකුත් දේශපාලන පක්ෂවල ආධාරකරුවන්ට හා සාමාජිකයින්ට තර්ජනාත්මක ප්‍රකාශයක් කිරීම සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් 2024.09.07 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන ආරම්භ කර ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු ගරු අධිකරණය මඟින් නිකුත් කරන ලද නියෝග අනුව වීඩියෝ පටයෙහි ප්‍රචාරය වන කටහඬ මෙම පුද්ගලයාගේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා වීඩියෝ පටය රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කර ඇත.

තවද මෙම පුද්ගලයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ඔහුගේ ප්‍රකාශයක් සටහන් කර ඇත. එසේම මෙම තර්ජනාත්මක ප්‍රකාශය ඇතුළත් හඬ පටය පිළිබඳව සංවිධාන කිහිපයක් විසින් ද මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිහිපයක් ඉදිරිපත්කර ඇත.

**මෙම වීඩියෝ පටයෙහි පෙනී සිටින පුද්ගලයා කිරිබත්ගොඩ ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 47 ක් වන හිටපු යුධ හමුදා මේජර්වරයෙකු බවට අනාවරණය වී ඇති අතර** පරිඝණක අපරාධ විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**